මහ **කොමසාරිස්** කාර්යාලය
**කොළඹ**

පුවත්පත් නිවේ**දනය**

**ඉන්දියානු ධීවරයන් අත්අඩංගුවට ගැනීමේදී ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් වෙඩි තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් ඉන්දියාව දැඩි විරෝධය පළ කරයි**

අද අලුයම ඩෙල්ෆ්ට් දූපත ආසන්නයේදී ඉන්දිය ධීවරයන් 13 දෙනෙකු අත්අඩංගුවට ගැනීමේදී ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් වෙඩි තැබීමේ සිද්ධියක් වාර්තා විය. ධීවර යාත්‍රාව තුළ සිටි ධීවරයන් 13 දෙනා අතුරින් දෙදෙනෙකු බලපතළ තුවාල ලබා ඇති අතර ඔවුහු මේ වන විට යාපනය ශික්ෂණ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටිති. තවත් ධීවරයන් තිදෙනෙකුට සුළු තුවාල සිදු වී ඇති අතර ඔවුන් ද ඒ සඳහා ප්‍රතිකාර ලබා ඇත. යාපනයේ ඉන්දීය කොන්සියුලර් ජනෙරාල් කාර්යාලයේ නිලධාරීහු රෝහල වෙත පැමිණ තුවාල ලැබූ ධීවරයන්ගේ සුව දුක් විමසා ඇති අතර ධීවරයන් සහ ඔවුන්ගේ පවුල් සඳහා හැකි සෑම සහයෝගයක්ම ලබා දෙමින් සිටිති.

2. නව දිල්ලියේ සිටින වැඩ බලන ශ්‍රී ලංකා මහ කොමසාරිස්තුමිය අද උදෑසන විදේශ කටයුතු අමාත්‍යාංශයට කැඳවා මෙම සිදුවීම සම්බන්ධයෙන් දැඩි විරෝධය පළ කරන ලදී. කොළඹ පිහිටි අපගේ මහ කොමසාරිස් කාර්යාලය ද ශ්‍රී ලංකා රජයේ විදේශ අමාත්‍යාංශයට මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කර ඇත.

3. ඉන්දියානු රජය සෑමවිටම ජීවනෝපාය පිළිබඳ අවධානය යොමු කරමින් ධීවරයන් සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් මානුෂීය ආකාරයකින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇත. කිසිදු තත්ත්වයක් යටතේ බලය යොදගැනීම පිළිගත නොහැකිය. මේ සම්බන්ධයෙන් දෙරටෙහි රජයන් අතර පවතින අවබෝධතා දැඩිව අනුගමනය කළ යුතු වේ.

***

**කොළඹ**
***2025*** ජනවාරි ***28***

මූලාශ්‍රය:
https://www.mea.gov.in/press-releases.htm?dtl/38953/India_lodges_strong_protest__on_an_incident_involving_firing_by_the_Sri_Lankan_Navy_during_apprehension_of_Indian_fishermen